චක්‍රලේඛ අංක - 02/2016

මගේ අංකය - CSD/3/1/6
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
බම්බලපිටිය.
2016-02-29

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම අධ්‍යක්ෂවරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන අණදෙන නිලධාරීන්,
සියලුම බලකා අණදෙන නිලධාරීන්/ පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්,

**<u>සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන ත්‍රිවිධ හමුදා සහ පොලිස් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දෛනික පැමිණීම සටහන් කිරීම</u>**

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන ත්‍රිවිධ හමුදා සහ පොලිස් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්/ සෙසු නිලයින් තම දෛනික පැමිණීම සටහන් කිරීම සඳහා පොදු 18 ආකෘතිය භාවිතා කල යුතුය. මෙම ආකෘතිය දෙපාර්තමේන්තු මූලස්ථානයේදී අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේද බලකා මූලස්ථානවල බලකා අණදෙන නිලධාරීගේද අධීක්ෂණය යටතේ පවත්වාගෙන යා යුතු වේ.

02. ඉහත සඳහන් සියලුම නිලධාරීන් රාජකාරි වේලාව තුළ සේවා ස්ථානයෙන් බැහැර යන්නේ නම් දෙපාර්තමේන්තු මූලස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ ද සෙසු නිලයින් දෙපාර්තමේන්තු මූලස්ථානයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ ද බලකා මූලස්ථානවල බලකා අණදෙන නිලධාරී කාර්යාලයේ ද පවත්වා ගෙන යන බැහැර යාමේ ලේඛනයක සටහන් කර විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් පසු බැහැර යා යුතු වේ. එමෙන්ම එලෙස ගොස් පැමිණීමෙන් පසු පැමිණීමේ වේලාව එම ලේඛනයේ නියමිත පරිදි සටහන් කල යුතු ය.

03. මෙම චක්‍රලේඛය 2016.03.01 දින සිට ක්‍රියාත්මක වන අතර මේ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කරන ලෙස මෙයින් දන්වනු ලැබේ.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව